සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සතුන් සඳහා පලතුරු ලබා දීම, පිෂ් ස්පා, අලීන් ස්නානය හා ළමා මලුව සඳහා ටිකට්පත් අලෙවියෙන් ලද ආදායම තුළ ඇතුළත් එකතු කළ අගය මත බදු මුදල් රු. 8,294,320 ක් එකතු කළ අගය මත බදු පාලන ගිණුමට බැර කිරීම වෙනුවට අදාළ ටිකට්පත් ආදායම් ගිණුමට බැර කර තිබීම හේතුවෙන් ටිකට්පත් අලෙවි ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ශේෂය අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	සතුන් සඳහා පළතුරු, පිෂ් ස්පා, අලීන් ස්නානය හා ළමා මළුව සඳහා ටිකට්පත් අලෙවියේදී, බදු අයකිරීම පිළිබඳව තහවුරු කරගැනීමෙන් පසුව වැට් වටිනාකම වූ රු.8,294,320 ක මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට කටයුතු කරන බවත්, 2025 වර්ෂයේ සිට ඒ අනුව, වැට් ගෙවීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි.	පිළිතුරු ලබා දී ඇත්තේ විගණන නිරීක්ෂණයෙන් කොටසකට පමණි. නිවැරදිව ගිණුම් තැබීම සම්බන්ධයෙන් නිලධාරීන් වගකිව යුතු වේ.
(ආ)	අලෙවිසැල් කුලියට දීම වෙනුවෙන් ලැබිය යුතු විදුලි බිල්පත් ගාස්තු රු.2,218,016 ක් වර්ෂයේ විදුලි බිල්පත් ආදායම් ගිණුමට හා ලැබිය යුතු විදුලි බිල්පත් ගිණුමට නිවැරදිව ගිණුම්ගත කර තිබියදී නැවත විදුලි වියදම් ගිණුමට ද බැර කර තිබුණි.	විදුලි බිල්පත් ආදායම වන රු.2,218,016 ක මුදල අතපසුවීමකින් විදුලි වියදම් ගිණුමට බැර කර ඇති අතර, 2025 වර්ෂයේ ගිණුම් සැකසීමේදී එය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	නිවැරදිව ගිණුම් තැබීම සම්බන්ධයෙන් නිලධාරීන් වගකිව යුතු වේ.
(ඇ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය තුළ මූල්‍ය නොවන සංචලනයන් යටතේ පැවති ගිණුම් ශේෂ 05 ක සංචලනයන් රු.8,180,288 ක වෙනසක් සහිතව දක්වා තිබුණි.	එම වෙනස්කම් සියල්ල 2025 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	නිවැරදිව ගිණුම් තැබීම සම්බන්ධයෙන් නිලධාරීන් වගකිව යුතු වේ.
(ඈ)	සතුන් ප්‍රත්‍යාගණන සංචිත ශේෂයෙන් අඩුකළ නොහැකි අයිතමයක් වූ සතුන් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරන ලද රු.948,588 ක වියදම, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනයේ සතුන් ප්‍රත්‍යාගණන සංචිතයෙන් අඩුකර දක්වා තිබුණි.	සතුන් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරන ලද වියදම් වන රු.948,588 ක මුදල, සත්ව ප්‍රත්‍යාගණන ගිණුමට අදාල ගෙවීමක් වන බැවින් එම ගිණුමට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.	නිවැරදි ගිණුම්කරණ ක්‍රම අනුගමනය කිරීමට නිලධාරීන් වගකිව යුතු වේ.

(ඉ)	රු.32,561,361 ක් වූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ආදායම් ප්‍රකාශනයේ වෙනත් වියදම් යටතේ දැක්විය යුතු වුවද, එය ප්‍රවේශපත්‍ර ආදායමින් අඩුකර එකතු කල අගය මත බදු පාලන ගිණුමට ගැලපුම් කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රවේශපත්‍ර ආදායම සහ වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්විණි.	2025 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී එම මුදල වෙනත් වියදම් යටතේ ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	නිවැරදිව ගිණුම් තැබීම සම්බන්ධයෙන් නිලධාරීන් වගකිව යුතු වේ.

1.5.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2, 4.2.3 හා 5.3.10 මාර්ගෝපදේශයන්	2023 වර්ෂය සඳහා දෙහිවල සත්වෝද්‍යානයට රු.7,982,747 ක් වටිනාකමැති ඖෂධ මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී විධිමත් පරිදි ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කර නොතිබුණු අතර දින 91 ක් විය යුතු ලංසු වලංගු කාල සීමාව දින 230 ක් දක්වා දීර්ඝ කර තිබුණි.	රාජ්‍ය ඔසුසලෙහි නියෝජනය කිරීම සඳහා සහභාගි වීමට නොහැකි බව ලිඛිතව දන්වා තිබිණි. ඖෂධවේදීන්ද දෙපාර්තමේන්තුව තුළ නොමැති බැවින් ඇගයීම් කටයුතු සිදු කරන්නේද පශු වෛද්‍යවරුන් වන අතර, නිර්දේශ ලබාදීමට සැලකිය යුතු කාලසීමාවක් වැයවීම හේතුවෙන් වලංගු කාලසීමාව දීර්ඝ කිරීම සිදු කර ඇත.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය න්ට අනුගත විය යුතුවේ.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.250,704,411 ක ලාභයක් වූ අතර, ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ අලාභය රු.187,636,878 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.438,341,289 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රවේශ පත්‍රවල මිල ගණන් ඉහළ දැමීමත්, පැමිණෙන නරඹන්නන් සංඛ්‍යාව ඉහළ යාමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රිදියගම සෆාරි උද්‍යානයේ ප්‍රවේශපත් කවුළුව වෙතින් පාසල් ළමුන් සහ පෙර පාසල් ළමුන් සඳහා ප්‍රවේශපත් නිකුත් කිරීමට භාවිතා කරන ලද පොදු 172 කුවිතාන්සි පොත්වල දෙවන පිටපත පරීක්ෂාවේදී අවිධිමත්ව ලියන ලද කුවිතාන්සි නිරීක්ෂණය වූ අතර, ඊට	මෙම සිද්ධිය අනාවරණය වූ වහාම ඊට සම්බන්ධ ගාස්තු අය කිරීමේ සහකාරවරයාගේ වැඩ තහනම් කර දෙපාර්තමේන්තු විමර්ශනයක් සිදු කරන ලදි.	වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

	අදාළ මුල් පිටපත්වල සඳහන් තොරතුරු තෙවන පාර්ශව වෙතින් තහවුරු කර ගැනීමේදී වංචා සහගතව දෙවන පිටපත වෙනස්කර තිබුණි. තෝරාගත් කුවිතාන්සි 270 ක් අතුරින් තෙවන පාර්ශව වෙතින් සනාථ කර ගැනීමට හැකි වූ කුවිතාන්සි 20 කින් කුවිතාන්සි 15 කම එනම් තහවුරු වූ ප්‍රමාණයෙන් 75% ක් වූ කුවිතාන්සි වෙනස් කර තිබුණි.		
(ආ)	ව්‍යාජ ලෙස වෙනස් කර ඇති බවට තහවුරු කර ගැනීමට හැකි වූ කුවිතාන්සි 15 මඟින් දෙවන පිටපත තුළ ඇතුළත් නරඹන්නන් සංඛ්‍යාව සහ ගාස්තු ප්‍රමාණයන් මුල් පිටපතෙහි ඇතුළත් සංඛ්‍යාවට වඩා අඩුවෙන් ඇතුල් කිරීම තුළින් රු.53,690 ක මූල්‍ය වංචාවක් සිදු කර තිබුණි.	ව්‍යාජ ලෙස වෙනස් කර ඇති බවට තහවුරු කරගැනීමට හැකි වූ කුවිතාන්සි 15 ට අදාල ගාස්තුව වන රු.53,690 ක මුදල අය කර ගැනීමට නිර්දේශ කරන ලදි.	වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	අවිධිමත් ආකාරයෙන් ලියා තිබූ එහෙත් තෙවන පාර්ශවයන්ගෙන් තහවුරු කිරීම් විගණනය වෙත ලබාගත නොහැකි වූ එකතුව රු.1,353,696 ක කුවිතාන්සි 250 ක් ද විය.	විධිමත් විමර්ශනයක් පවත්වා අවිධිමත් ලෙස ලියන ලද ඉතිරි කුවිතාන්සි 250ට අදාල තෙවන පාර්ශවයන්ගෙන් තොරතුරු ලබා ගෙන වංචාවක් සිදු වී ඇති දැයි පරික්ෂා කිරීම සුදුසු බව නිර්දේශ කරන ලදි.	වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ දිවයින පුරා ක්‍රියාත්මක සත්වෝද්‍යාන සඳහා දෙපාර්තමේන්තු නිළධාරියකු විසින් සකස් කර තිබූ ස්වයංක්‍රිය ටිකට්පත් නිකුත් කිරීමේ පද්ධතියක් ස්ථාපනය කර පවත්වාගෙන යනු ලබන අතර මෙම පද්ධතිය ආරම්භ කිරීම ආයතනික ක්‍රියාවලියට ඉතාමත් වැදගත් කටයුත්තක් මෙන්ම කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සහ වංචා සහ වැරදි වළක්වා ගැනීමට මෙන්ම වාර්තාකරණය සහ ආදායම් කළමනාකරණය පිළිබඳ විධිමත් භාවයක් ද	මෙම පද්ධතියේ භාවිතය සම්බන්ධයෙන් උප ආයතන 04 සඳහා නඩත්තු කටයුතු සහ යාවත්කාලීන කටයුතු සිදුකිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත තොරතුරු තාක්ෂණික නිලධාරීන්ගේ සේවය ලබාගැනීමට කටයුතු සලසා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.	ස්වයංක්‍රිය ටිකට්පත් නිකුත් කිරීමේ පද්ධතිය ආයතනය යටතට නිල වශයෙන් පවරා ගැනීම හා පද්ධතියේ අඛණ්ඩ ක්‍රියාකාරීත්වය, දිවයින පුරා ඒකාකාරීභාවයකින් සහ ස්ථාවරභාවයකින් පවත්වාගෙන යාම කෙරෙහි කළමනාකාරීත්වයේ අවධානය යොමු විය යුතුවේ.

	මෙමඟින් ඇති කර තිබුණද පද්ධතිය ආයතනය යටතට නිල වශයෙන් පවරා ගෙන නොතිබීම, පද්ධතියේ අඛණ්ඩ ක්‍රියාකාරීත්වය, දිවයින පුරා පද්ධතියේ ඒකකාරී භාවය සහ ස්ථාවර භාවය සහ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා නියමිත අධීක්ෂණ ක්‍රමයක් සකස් කර නොතිබීම සහ නඩත්තු සහ යාවත්කාලීන කිරීම් සඳහා වගකිව යුතු නිලධාරීන් පත් කර නොතිබීම යන පරිපාලනමය ගැටළු පැවතුණි.		
(ආ)	2024 වර්ෂයේදී සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සත්වෝද්‍යාන සඳහා එළවළු සහ පලා වර්ග මිලදී ගැනීම සඳහා රු.69,428,799 ක් වටිනාකම වූ ප්‍රසම්පාදනයන් සැපයුම්කරුවන් වෙත ප්‍රදානය කර තිබුණි. ඒ තුළ දෙපාර්තමේන්තුවට අයත් ගොවිපලවල් තුළ පහසුවෙන් වගා කළ හැකි සහ දැනටමත් වගා කරනු ලබන කන්කුන් 63103kg ක්, මුගුණුවැන්න 8700kg ක් සහ ගොටුකොළ 2730kg ක්ද ඇතුළත්ව තිබුණු අතර ඒවායේ ප්‍රසම්පාදන වටිනාකම රු.17,841,373 ක් වී තිබුණි. එය සමස්ත එළවළු ප්‍රසම්පාදන වටිනාකමින් සියයට 25 ක් පමණ විය. වාර්ෂික අවශ්‍යතාවයන්ගෙන් කංකුන් 10,103kg ක් සහ ගොටුකොළ 2.5kg පමණ ගෝනපල ගොවිපල තුළින් 2024 වර්ෂයේ මුල් මාස 06 තුළ සපයා තිබුණු අතර, ගොවිපල මනා ලෙස සංවර්ධනය කිරීම තුළින් හා භූමිය ඵලදායිව යොදා ගැනීම තුළින් ඉහත පලා වර්ග අවශ්‍යතාවය ගොවිපලවල් තුළම වගා කර ගත හැකි බවත් එමඟින් වාර්ෂිකව ඒ සඳහා වැය වන විශාල පිරිවැයක් අවම කර ගත හැකි බවත් නිරීක්ෂණය විය.	මේ වනවිට කහපොළ සහ ගෝනපොල ගොවිපොළ මඟින් සමස්ත කංකුන්, ගොටුකොළ සහ මුකුණුවැන්න නිෂ්පාදනය දෛනිකව ලබාදෙනු ලබයි.	භූමිය ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතුවේ.

(ඇ)	දෙපාර්තමේන්තුව යටතේ පවතින උද්‍යාන නැරඹීමට පැමිණෙන්නන් හට එක් තැනැත්තෙකුට එක් මුද්‍රිත ප්‍රවේශ පත්‍රයක් බැගින් නිකුත් කරනු ලැබුවද රිදියගම සෆාරි උද්‍යානයේ පාසල් ළමුන් සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍ර 2023 දෙසැම්බර් මස 23 වන දින සිට අවසන් වී තිබුණු අතර විගණන පරීක්ෂාව සිදුකළ 2025 මැයි 09 වන විටත් පාසල් ළමුන් සඳහා ප්‍රවේශපත් නිකුත් කිරීමේදී පාසල් ළමුන් කණ්ඩායමකට එක් රිසිට්පතක් වන සේ පොදු 172 ආකෘති පත්‍රය මඟින් ප්‍රවේශ පත් නිකුත් කර තිබුණි.	පාසල් ළමා ප්‍රවේශපත්‍ර මුද්‍රණය කිරීම සඳහා කඩදාසි නොමැති වීම මත පාසල් ළමා කණ්ඩායම් වෙත පොදු 172 රිසිට්පත් නිකුත් කරන ලෙස දැනුම් දෙන ලද අතර, 2024 දෙසැම්බර් මස සිට POS machine භාවිතා කිරීම ආරම්භ කරන ලද බැවින් පොදු 172 රිසිට්පත් නිකුත් නොකරන බව දන්වා සිටිමි.	ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	මුල්‍ය ප්‍රකාශනවල 2022 වර්ෂයේ සිට පැවත එන රු.28,553,213 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (Mobilization Advance) මුදල අදාළ පාර්ශවයන්ගෙන් වැඩ අවසන් කිරීමේ බිල්පත් ගෙන්වාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයට ගෙවන ලද අත්තිකාරම් මුදල් පියවා ගැනීමට නොහැකි වී ඇත්තේ ඉදිකිරීම් ව්‍යාපෘතීන්හි දුර්වල ප්‍රගතිය හේතුවෙන් එම ව්‍යාපෘතින්ගේ කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සහ වැඩ අවසන් කරන ලද ලද ව්‍යාපෘතීන්හි සිදුකරන ලද කාර්යයන් සඳහා බිල් පත් ඉදිරිපත් නොකිරීම හේතුවෙනි.එබැවින් නොපියවූ අත්තිකාරම් රු.29,734,197.00 ක මුදල, නිදහස් නොකරන ලද රැඳවුම් මුදල් (Retention) රු.15,675,960.11 ක මුදල සහ කාර්යයන් (Work done) සිදුකර ඇති නමුත් බිල්පත් ඉදිරිපත් නොකරන ලද හා ගෙවීම් සිදු නොකරන ලද ව්‍යාපෘතින්ගේ, සිදුකරන ලද කාර්යයන් (Work done) සඳහා ගණනය කරන ලද මුදල වන රු. 33,011,524.49 ක මුදලෙනි.ඒ අනුව ජාතික	අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

		යන්ත්‍රෝපකරණ ආයතනය වෙත නිදහස් නොකරන ලද රැඳවුම් මුදල් (Retention) ප්‍රමාණය වන රු. 15,675,960.11 ක මුදල රජයේ ආදායමට බැර කර ඇති අතර එම ආයතනය වෙත ගෙවීමට ඇති රු. 33,011,524.49 ක මුදල එම ආයතනය වෙත නොගෙවනු ලැබේ.	
(ඉ)	ගොවිපලවල් ඵලදායීව හා එහි භූමිය පූර්ණ උපයෝජනයකින් යුතුව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පුහුණු ශ්‍රමය සපයා නොමැති බව සිදුකළ භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. ගොවිපලවල සිටින කම්කරුවන් සංඛ්‍යාව සැසඳීමේදී ගෝනපල ගොවිපලෙහි එක් කම්කරුවෙක් හට අක්කර 1.07 ක්ද කහපොල ගොවිපලෙහි එක් කම්කරුවෙක් හට අක්කර 17.75 ක්ද ආවරණය කිරීමට සිදු වී තිබුණි.	කහපොළ සඳහා පුහුණු ශ්‍රමය සපයා නොමැත. දෛනික නුපුහුණු ශ්‍රමිකයන් මඟින් කහපොළ ගොවිපළ පවත්වාගෙන යනු ලබයි. ගෝනපොල ගොවිපොළ සඳහා පුහුණු ශ්‍රමය ප්‍රමාණවත්ව සපයා ඇත.	පාලන පද්ධතිය වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතු වේ.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ)	දෙහිවල සත්වෝද්‍යානයේ රු.මිලියන 45 ක ප්‍රතිපාදන යටතේ නිම කිරීමට අපේක්ෂිතව පැවති කාර්යයන් 04 ක් වර්ෂය තුළදී නිම කර ගැනීමට අපොහොසත් වී තිබුණු අතර කඩිනමින් සිදු කළ යුතු අන්තරාදායක රූහැන් ඉවත් කිරීමෙහි භෞතික ප්‍රගතිය සියයට 15 මට්ටමක පැවතුණි.	මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තු ගත පිරිවැය මිලියන 100ක් පමණ වන අතර මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන හිමිවන්නේ කොටස් වශයෙනි.	ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කළ යුතුවේ.
(ආ)	පින්නවල සත්වෝද්‍යානයේ කාර්යයන් සඳහා වෙන් කර ඇති මුළු ප්‍රතිපාදනයෙන් රු.මිලියන 23.18 ක් එනම් සියයට 50 ක ප්‍රතිපාදන බීළාල කුළයේ කුඩා සතුන් සඳහා අරණක් ඉදිකිරීම සඳහා වෙන් කර තිබුණද එහි භෞතික ප්‍රගතිය සියයට 15 ක් විය. එසේම සමාලෝචිත වර්ෂය තුළ සිංහයන් ප්‍රදර්ශනාගාරයේ (Lion Exhibition) පළමු අදියර නිම කර අවසන් කිරීමට රු.මිලියන 9 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද එම කාර්ය සිදු කර නොතිබුණි.	1) බීළාල කුළයේ කුඩා සතුන් සඳහා අරණක් ඉදිකිරීම ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශයේ උපදේශකත්වයෙන් සිදු කරනු ලැබූ අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් තෝරා ගන්නා ලද ඉදිකිරීම් ආයතනය වෙත 2024/12/17 දින සිට දින 180 කින් වැඩ අවසන් කිරීමට භාර දී ඇත.	ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කළ යුතු වේ.

		2025/04/30 දින වන විට භෞතිකව 65% ක ප්‍රගතියක් ලබා කර ගෙන ඇත. 2) පින්නවල සත්වෝද්‍යානයේ සිංහයන් සඳහා අරණක් ඉදි කිරීමට 2024 වර්ෂයේදී අවශ්‍ය සැළසුම් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශාය මඟින් ඉටු කරවා ගැනීමට සැළසුම්කර තිබූ අතර එම අරණ ඉදි කරන ස්ථානය තීරණය කිරීම සඳහා භූමියේ මිනින්දෝරු සැළැස්මක් සැකසීමට අවශ්‍ය වූ නිසා 2024 වර්ෂයේදී සැලසුම් සැකසීම නිමා කිරීමට නොහැකි විය.	
(ඇ)	හම්බන්තොට සෆාරි උද්‍යානයේ කාර්යයන් 06ක් සඳහා රු.මිලියන 38.44 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර, රු.මිලියන 37.44 ක් එනම් මුළු ප්‍රතිපාදනයෙන් සියයට 92.4 ක් වෙන් කර තිබූ කාර්යයන් වල භෞතික ප්‍රගතිය සියයට 20 සහ ඊට අඩු මට්ටමක පැවතුණි.	එක් කාර්යක් සඳහා කාලගුණික වාර්තා ලබා ගැනීමට ප්‍රමාද වීම, කාර්යන් දෙකක් සඳහා ඉංජිනේරුවරුන් නොමැතිවීම, එක් කාර්යක් සඳහා ලංසු කැඳවීම දෙවරක් කිරීමට සිදුවීම හා ශ්‍රම හිඟය ප්‍රගතිය අඩුවීමට හේතුවී ඇත.	ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කළ යුතු වේ.
(ඈ)	පින්නවල අලි අනාථාගාරයේ අලි මඩු ගොඩනැගීම සඳහා රු.මිලියන 33 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද එම මඩුවල දැනට සිටින අලි ඉවත් කිරීමේ පූර්ව සැලසුම් නොමැති වීම සහ ඇස්තමේන්තු සකස් කිරීමේ ප්‍රමාදයන් නිසා වර්ෂය අවසාන වන විටත් ටෙන්ඩර් ඇගයීම් මට්ටමේ පැවතුණි.	අලි මඩු 03 එකවර අලුත්වැඩියා කිරීමට එම මඩුවල සිටින අලි ඉවත් කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සහ ආරක්ෂා සහිත ස්ථාන නොමැති වීම නිසා 2024 වර්ෂයේදී එක් මඩුවක් පමණක් අලුත්වැඩියා කිරීමට සිදුවිය. අදාළ අලුත්වැඩියා සිදුකිරීම සඳහා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත පවරා දී තිබුණි. එම ආයතනය විසින් අදාළ සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීමට වැඩි කාලයක් ලබාගැනීම	ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වේ.

		නිසා ප්‍රමාද වී ඇත. නමුත් අදාළ ව්‍යාපෘතිය 2024.10.23 දින ආරම්භ කර ඇති අතර 2025.03.30 දින වන විට අවසන් කර ඇත.	
(ඉ)	සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සඳහා ආහාර නිෂ්පාදනය කිරීමේ අරමුණින් පවත්වාගෙන යන අක්කර 71 ක වපසරියකින් යුතු කහපොල ගොවිපල ඉඩමෙහි අක්කර 30 ක පමණ ප්‍රමාණයක වගා කටයුතු සිදු කරමින් පවතින අතර ඉතිරි අක්කර 41 ක් පමණ වූ භූමි ප්‍රමාණය නිශ්කාර්යව පැවතුණි.	කහපොල ගොවිපලේ ආහාර නිෂ්පාදන කටයුතු 2022 වසරේ ඇරඹුනද විටින් විට කැබිනට් පත්‍රිකා ඉදිරිපත් වීම හේතුවෙන් එහි නිෂ්පාදන කටයුතු සහ සංවර්ධන කටයුතු විටෙක සම්පූර්ණයෙන් නැවතීමට උපදෙස් ලද බැවින් එය මෙහි වගා කටයුතු දැඩි ලෙස අඩාල වීමට හේතු විය. මෙම වසරේදී වගා කටයුතු නැවත අරඹා ඇති අතර කැබිනට් පත්‍රිකා මඟින් බාධා ඇති නොවුනහොත් කහපොල ගොවිපලෙහි වගා කටයුතු සාර්ථකව ඉටු කර ගත හැකි වේ.	භූමිය ඵලදායීව යොදා ගැනීමට කටයුතු කළ යුතුය.

4. **අයවැය පාලනය**

විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	නිර්දේශය
සමාලෝචිත වර්ෂය සඳහා අනුමත කරන ලද අයවැය ඇස්තමේන්තුව සහ සත්‍ය වියදම සැසඳීමේදී වැය විෂයයන් 02 ක එකතුව රු.2,151,137 ක් අයවැය ඇස්තමේන්තුව ඉක්මවා වැයකර තිබුණි.	සමාලෝචිත වර්ෂය සඳහා අනුමත කරන ලද අයවැය ඇස්තමේන්තුව, සංශෝධනය කර නැවත සකස් කරන ලද අතර, ඒ සඳහා අනුමැතිය ලබාගෙන ඇති බවත් අයවැය ඇස්තමේන්තුව ඉක්මවා නොමැති බවත් කාරුණිකව දන්වා සිටිමි.	සංශෝධිත ඇස්තමේන්තුව අනුවද ඇස්තමේන්තුව ඉක්මවා වියදම් දරා ඇත. වියදම් සීමා නොඉක්මවීමට වග බලා ගත යුතුවේ.